ET/SSS/2022(2023)/OL/87/S/A/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Communication and Media Studies

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය




## Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

# පත්‍රය I - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 1 | 21 | 4 | 31 | 2 |
| 02 | 4 | 12 | 2 | 22 | 4 | 32 | 2 |
| 03 | 1 | 13 | 1 | 23 | 2 | 33 | 1 |
| 04 | 2 | 14 | 2 | 24 | 3 | 34 | 1 |
| 05 | 1 | 15 | 3 | 25 | 1 | 35 | 3 |
| 06 | 2 | 16 | 1 | 26 | 4 | 36 | 4 |
| 07 | 3 | 17 | 2 | 27 | 3 | 37 | 1 |
| 08 | 1 | 18 | 3 | 28 | 1 | 38 | 1 |
| 09 | 3 | 19 | 2 | 29 | 3 | 39 | 1 |
| 10 | 4 | 20 | 4 | 30 | 2 | 40 | 2 |

විශේෂ උපදෙස් - එක් පිළිතුරකට ලකුණු 01 බැගින්

මුළු ලකුණු 1 X 40 = 40

*****

## ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - | 20 |
| 2 වන ප්‍රශ්න සඳහා තෝරාගත් ප්‍රශ්න 04 ලකුණු 10 බැගින් | - | 40 |
| | | 60 |

## කොටස් ලකුණු බෙදීම

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | | |
|---|---|---|---|
| I. | කොටසට | - | ලකුණු 1 |
| II. | කොටසට | - | ලකුණු 2 |
| III. | කොටසට | - | ලකුණු 3 |
| IV. | කොටසට | - | ලකුණු 4 |
| | | | 10 |

# පත්‍රය II - පිළිතුරු

1)

(I) ජන සන්නිවේදනය

(II) සන්දේශය පොදු වූවකි.

සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.

සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ.

ග්‍රාහක පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගනියි.

වෘත්තීය සන්නිවේදක කටයුතු කරති.

මූලික වශයෙන් ඒකමාර්ගික ව සිදු වේ.

තාක්ෂණික උපකරණ භාවිතයට ගැනේ.

සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ඇත්තේ දූරස්ථ සම්බන්ධයකි.

සාපේක්ෂ ව ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වේ.

ජන මාධ්‍ය සන්නිවේදනය සාමූහික කාර්ය පද්ධතියකි.

(III) ජනමාධ්‍ය වැඩසටහන්, අත්පත්‍රිකා, පොස්ටර්, නව මාධ්‍ය විධික්‍රම, සමාජ මාධ්‍ය පෝස්ටු

(IV) ආයතනික මූලාශ්‍ර, පුද්ගල මූලාශ්‍ර, මාධ්‍ය මූලාශ්‍ර, ලිඛිත මූලාශ්‍ර

(V) ඕපාදූප දාමය, තනි දාමය, සම්භාවිතා දාමය, පර්ෂද දාමය

(VI) සම්මුඛ සාකච්ඡා

ප්‍රශ්නාවලිය

නිරීක්ෂණය

ලේඛන පරිශීලනය

බුද්ධි කලම්භනය

(VII)

- ක්ෂණික ව පුවත් දැන ගැනීමේ හැකියාව
- ගබඩා කර තබා ගැනීමේ පහසුව
- නැවත නැවත කියවිය හැකි වීම
- තොරතුරු විෂයයන් අනුව වර්ග කරමින් පළ කොට තිබීම
- යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩිවීම
- ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම

(VIII) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය

කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය

ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය

බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය

අන්තර් ක්‍රියාකාරී පුවරුව

(IX) Facebook, Twitter, Instagram, WhatsApp, Viber, Imo

(X)

- ආයතනයේ තොරතුරු වහා ම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කර ගත හැකි වීම
- ආයතනයේ තොරතුරු යාවත්කාලීන කිරීම
- ආයතනයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම
- ආයතනයේ කටයුතු වඩාත් විධිමත් ව හා පිළිවෙළකට කළ හැකි වීම
- ආයතනයේ තොරතුරු වේගවත් ව නිකුත් කළ හැකි වීම
- වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර වහා ලබා ගත හැකි වීම

(2)

(I) ශ්‍රව්‍ය, දෘශ්‍ය සන්නිවේදනය

(II) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.
සමීප මාධ්‍යයකි.
සජීව මාධ්‍යයකි.
ජන මාධ්‍යයකි.
අස්ථායී මාධ්‍යයකි.
වියදම් අධික මාධ්‍යයකි.

(III) ප්‍රවෘත්ති
වාර්තා වැඩසටහන්
ටෙලි නාට්‍ය
සංගීත වැඩසටහන්
සාකච්ඡා, සංවාද
සඟරාමය වැඩසටහන්
යථාකාරී රූපවාහිනී වැඩසටහන්

(IV)

(1) ප්‍රතිසම තාක්ෂණයෙන් (Analog) අංකිත (Digital) තාක්ෂණයට පරිවර්තනය වීම
(2) චන්ද්‍රිකා තාක්ෂණික රූපවාහිනී විකාශනය
(3) රූපවාහිනී ඔස්සේ ත්‍රිමාන (3D)ආකාරයේ දර්ශන ලබා ගැනීමේ හැකියාව
(4) ප්‍රමාණයෙන් කුඩා වීම, පින්තූරයක් ලෙස බිත්තියේ රැඳවීමට හැකි වීම
(5) පැහැදිලි පින්තූර - HDTV High definition Television
(6) විවිධ හැඩයේ වැඩසටහන් ආකෘති හඳුන්වා දීම

(3)

(i) දින මුද්‍රා යන්ත්‍රය
නිල මුද්‍රාව
ගණක යන්ත්‍රය
පරිගණකය
ඡායා පිටපත් යන්ත්‍රය
තැපැල් මුද්‍රා යන්ත්‍රය
මුදල් සටහන් යන්ත්‍රය
මුදල් ගණින යන්ත්‍රය

(ii) විද්‍යුත් තැපැල
ෆැක්ස් යන්ත්‍රය

සුහුරු ජංගම දුරකථනය

(iii) අත් පිටපත සැකසීම
අකුරුයෝජනය හා පිටු සැලසුම් කිරීම
මුද්‍රණය හා පිටපත්කරණය
නිමි කටයුතු

(iv) අඩු පිරිවැය
ආකර්ෂණීය නිමාව
ඉක්මන් බව
පහසුව
කාර්යක්ෂමතාව
නම්‍යශීලීභාවය

**(4)**

(i)




(ii) තොරතුරු සැපයීම
අධ්‍යාපනය ලබා දීම
විනෝදාස්වාදය ලබා දීම
පෙළඹවීම
සමාජානුයෝජනය
සංවාද හා සාකච්ඡා
සංස්කෘතික ප්‍රගමනය
ඒකාබද්ධතාව

(iii)

- සන්දේශය තුළ විවිධාර්ථ තිබීම
- වැරදි ලෙස තොරතුරු ගොනුකර සන්දේශය සැකසීම
- සන්දේශයේ තොරතුරු විකෘති වී තිබීම
- ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැළපීම

(iv) **අර්ථ බාධක**

සන්නිවේදකයා විසින් එවන ලද සන්දේශය ග්‍රහණය කර ගත හැකි නමුත් එය ඒ ආකාරයෙන් ම අර්ථ ගැන්වීමට ග්‍රාහකයාට නොහැකි වීමට ඇති වන බාධකයයි.

* උදා :- සන්නිවේදකයා යොදා ගෙන ඇති භාෂාව හෝ භාෂා රටාව, භාෂා විලාසය හෝ ග්‍රාහකයාට නොගැලපීම
* ග්‍රාහකයාගේ තේරුම් ගැනීමේ හැකියාව අඩු වීම
* යොදාගෙන ඇති යම් යම් සංකේත හෝ වචන හෝ විවිධාර්ථ සහිත වීම

- **මාධ්‍ය බාධක**

තාක්ෂණික බාධක මෙයින් අදහස් වේ. එනම් සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා සන්දේශය ගමන් කිරීමට යොදා ගන්නා මාධ්‍යයේ කුමන හෝ ස්ථානයක දී එම ගමනට ඇතිවිය හැකි යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන බාධා මාධ්‍ය බාධක ලෙස සැලකේ.

උදා :- සංඥා නොලැබී යාම
වීදුලිය විසන්ධි වීම
පරිසර බාධා නිසා තාක්ෂණික දෝෂ ඇති වීම

- **දොරටුපාල සංකල්පය**

සන්නිවේදනයේ සිට ග්‍රාහකයා වෙත යන සන්දේශ පාලනය කිරීමයි. ඇතැම් අවස්ථාවල යම් යම් සන්දේශ පාලනය කිරීමේ අවශ්‍යතාව මතු වේ. සන්නිවේදනය ක්‍රියාවලියේ යම් ස්ථානයක දී දොරටු පාලකයෙකු විසින් එම සන්දේශයේ අන්තර්ගතය හෝ එම ගමන් මාර්ගය හෝ එම ගමනාන්තය හෝ පාලනය කරන්නට හැකි ය.

- **සංජානනය**

කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කර ගෙන එය තේරුම් ගැනීම සංජානනයයි.

5

(i) පොත්
පුවත්පත්
සඟරා
පෝස්ටර්
අත් පත්‍රිකා

(ii) මාධ්‍ය අතර පවතින තරගකාරීත්වය
මාධ්‍ය ආයතනවල පවත්නා වාණිජ අරමුණු සහ සමාජ අරමුණු
එක් එක් ග්‍රාහකයාගේ ස්වභාවය වෙනස් වීම
එක් එක් ග්‍රාහකයාගේ රුචිකත්වය විවිධ වීම

ග්‍රාහකයාගේ සමාජ පසුබිම
ග්‍රාහක ගත කළ යුතු අවස්ථාව වෙනස් වීම

(iii) ප්‍රවෘත්ති
සංස්කාරක වැකිය
විශේෂාංග (විචාර, වාර්තා, සංවාද)
කාටූන්
තීරු ලිපි
ඡායාරූප වාර්තා
වෙළෙඳ දැන්වීම්

(iv) කාලානුරූපීව අන්තර්ගතය වෙනස්වීම
අන්තර්ගතයෙහි මුද්‍රණ ශිල්පීය විවිධතා තිබීම
අන්තර්ගතය ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණශීලී ආකෘති භාවිත කිරීම
අන්තර්ගතයෙහි පෙළ හා රූපය ගැළපීම

6.

(i) මාධ්‍ය අභිසාරිතාව

(ii) විවිධ මාධ්‍ය පිළිබඳ අවබෝධය ලබාගත යුතු වීම
එක ම අවස්ථාවේ මාධ්‍ය කිහිපයකට තොරතුරු සැපයීමට අවශ්‍ය නිපුණතා අත්පත් කර ගැනීම
නූතන මාධ්‍ය මෙවලම් භාවිත කුසලතා වර්ධනය කර ගැනීම
තරගකාරීත්වයට මුහුණ දීමට හැකියාව ඇති මාධ්‍යවේදියෙකු වීම

(iii) පුවත්පත්
පොත්
ගුවන්විදුලිය
සිනමාපට
ජංගම දුරකථනය
අන්තර්ජාලය
සඟරා

(iv) බොහෝ තොරතුරු ප්‍රමාණයක් දැනගැනීමට හැකි වීම
විචිත්‍රවත් ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් වීම
පෙළඹවීම
මාධ්‍ය වෙත ප්‍රතිචාර දැක්වීමට හැකි වීම

7.

(i) ආර්ථික නියෝජන අධ්‍යයනය

(ii) සාර්ථකව වැඩ කිරීම
අභියෝගවලට මුහුණ දීම
ව්‍යවසායකත්වය
දියුණුව අපේක්ෂා කිරීම
ස්වයං අභිප්‍රේරණය/ ස්වයං පෙළඹවීම
නව නිර්මාණ බිහි කිරීම/ හඳුන්වා දීම
නොපසුබට වීම
නව සැලසුම් සම්පාදනය
ජාතිකාභිමානය ඇති කිරීම

(iii) රූපවාහිනී නාට්‍ය
පෝස්ටර්
ඩිජිටල් පුවරු ප්‍රදර්ශනය
නිවේදන ප්‍රචාරය
දැන්වීම් පුවරු
ප්‍රචාරක/ දැන්වීම්/ හඬ පට
වීදි නාට්‍ය
ගීත ප්‍රචාරය
නව මාධ්‍ය ක්‍රියාකාරකම්
ඡායාරූප ප්‍රදර්ශනය

(iv) වෙබ් පෝස්ටු නිර්මාණය
WhatsApp කණ්ඩායම් හරහා තොරතුරු හුවමාරුව
වීඩියෝ නිර්මාණය/ ප්‍රචාරය
ටික් ටොක් නිර්මාණය
සංගීත වැඩසටහන්

*****